# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 5 දරන චන්දිම වීරක්කොඩි පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 මාර්තු මස 04 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 මාර්තු මස 07 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 17.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 006513—500 (2014/03)

## 2014 අංක 5 දරන චන්දිම වීරක්කොඩි පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2014 මාර්තු මස 04 වැනි දින]

එල්. ඩී.—ඕ. (අයි.එන්.සී.) 3/2012.

## චන්දිම වීරක්කොඩි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

''චන්දිම වීරක්කොඩි පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන හා ප්‍රකට පදනමක්, එකී පදනමේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී පදනමේ සියලු පරමාර්ථ හා එම පදනම හා සම්බන්ධ සියලු කාරණා සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවාගෙන තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, එම පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරවා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩ දීම යෝග්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2014 අංක 5 දරන චන්දිම වීරක්කොඩි පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

චන්දිම වීරක්කොඩි පදනම සංස්ථාගත කිරීම.

**2.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) චන්දිම වීරක්කොඩි පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''චන්දිම වීරක්කොඩි පදනම'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය භාවිතා කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. තව ද, එකී සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

2—PL 006513—2,200 (2012/01)

(2) 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංස්ථාව ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ හා සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ:—

(අ) අගහිඟකම් ඇති පාසල් සිසුන්ට තම අධ්‍යාපන කටයුතු දිගට ම පවත්වා ගෙන යෑමට හැකි වන පරිදි මූල්‍යමය හෝ වෙනත් ආකාරයකින් ආධාර කිරීම;

(ආ) අගහිඟකම් ඇති තැනැත්තන්ට සහන ලබා දීම;

(ඇ) විශ්වවිද්‍යාලවල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලා හැදෑරීම සඳහා තෝරා ගෙන ඇති අගහිඟකම් ඇති සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ඈ) දහම් පාසල් සහ පෙර පාසල් ගුරුවරුන් සඳහා වැඩමුළු, සාකච්ඡා සහ සම්මන්ත්‍රණ පැවැත්වීම සහ නීතිය මගින් නියම කරනු ලබන්නේ නම් අදාළ පළාත් අධ්‍යාපන අධිකාරී ආයතනවල අනුමතය ඇතිව පෙර පාසල් නගා සිටුවීම සඳහා දිරිදීමනා සැපයීම;

(ඉ) අගහිඟකම් ඇති අසරණ සහ රෝගී තැනැත්තන්ට ආහාර, රෝද පුටු, කිහිලිකරු, ඇස් කන්නාඩි සහ වෙනත් වෛද්‍ය උපකරණ සහ සහන ලබා දීමට සහය වීම;

(ඊ) අඩු වරප්‍රසාදලාභීන් ස්වයං රැකියා ව්‍යාපෘතිවල නිරත කරවීමට දිරිමත් කිරීම;

(උ) සියලු ආගම්වලට අයත් ආගමික ස්ථාන දියුණු කිරීම; සහ

(ඌ) ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පිහිටුවා ඇති සමාන අරමුණු සහිත සමිතිවල කටයුතුවලට සහාය වීම.

මධ්‍යම රජයේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කටයුතු සමග ගැටුම් ඇති නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව.

**4.** සංස්ථාව විසින් සිය පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, එම පරමාර්ථ රජයේ හෝ යම් පළාත් සභාවක අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් ඊට සමගාමීව කරගෙන යනු ලබන ක්‍රියාවන් සමග ගැටුම් සහගත තත්ත්වයන් ඇති නොවන ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, මෙම පනතේ විධිවිධානවලට සහ මෙම පනතේ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට අනුකූලව, සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන් හතර දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වූ (මෙහි මින්මතු "කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) කළමනාකරණ කමිටුවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ ප්‍රාරම්භක සාමාජිකයා වන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චන්දිම වීරක්කොඩි මහතා, කමිටුවේ ප්‍රථම සභාපතිවරයා විය යුතු ය.

(3) (අ) සංස්ථාවේ ප්‍රථම කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ පදනමේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර, එම කමිටුවේ සාමාජිකයන්, මෙම පනතේ රීතීන්ට අනුකූලව නව කමිටුවක් පත් කරන තුරු ධුර දැරිය යුත්තේ ය.

(ආ) මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට වසරක කාලයක් ඇතුළත සංස්ථාවේ ප්‍රථම කමිටුව පත් කිරීම හෝ තෝරා ගැනීම කළ යුතු වේ.

(4) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ඇතුළුව කමිටුවේ සෑම නිලධරයකුම වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලැබීම හෝ තෝරා ගැනීම කලයුතු අතර එම වසර තුනක කාලය අවසන් වීමෙන් පසුව එම නිලධරයා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත් කිරීමට හෝ තෝරා පත්කර ගැනීමට සුදුසු වන්නේ ය.

(ආ) මිය යෑම, ඉල්ලා අස්වීම, අශක්නුතාවයකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා යම් නිලධරයකුගේ ධුරය පුරප්පාඩු වන අවස්ථාවක දී, කමිටුව විසින් සංස්ථාවේ රීති සැලකිල්ලට ගෙන

එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා ගැනීම හෝ පත් කිරීම කරනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරාගත් හෝ පත් කරනු ලැබූ තැනැත්තා තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව:—

(අ) බැංකු ගිණුම් ආරම්භ කිරීමට, පවත්වා ගෙන යාමට සහ වැසීමට ද;

(ආ) පරිත්‍යාගයන් සහ ප්‍රදානයන් එකතු කිරීමට හෝ භාර ගැනීමට සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමට සහ ලබා ගැනීමට ද:

එසේ වුව ද, සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග, මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ බාහිර සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබාගත යුතු ය.

(ඇ) සංස්ථාවේ අරමුණු සඳහා වහාම අවශ්‍ය නොවන සංස්ථාවේ කිසියම් අරමුදල්, කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කිරීමට ද;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීමට, අත්කර ගැනීමට, බදු දීමට හෝ කුලියට දීමට, විකිණීමට හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීමට සහ තත්කාර්ය සඳහා නීත්‍යනුකූලව අත්කර ගැනීමට ද, සංස්ථාවේ පරමාර්ථ නංවාලීමේ අරමුණ ඇතිව අවස්ථානුකූල යයි පෙනී යන විට ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට හෝ බැහැර කිරීමට ද;

(ඉ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන ආකාරයෙන් සේවකයන් පත් කිරීමට, සේවයේ යෙදවීමට සහ ඔවුන් සේවයෙන් පහ කිරීමට ද;

(ඊ) සමාන අරමුණු ඇති දේශීය සහ විදේශීය ආයතන සමග සබඳතා ඇති කර ගැනීම සහ සම්බන්ධීකරණය කිරීමට ද; සහ

(උ) සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා සහ දේ කිරීමට ද සහ ක්‍රියාත්මක කිරීමට ද,

සංස්ථාවට බලය ඇත්තේ ය.

7. (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් එකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) නිලතල දරන්නන් සහ ඔවුන්ගේ ධුර කාලය, සේවයෙන් අස්වීම, ඉවත් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල හා කාර්ය;

(ආ) නිලතල දරන්නන් හැර, කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ ඔවුන්ගේ ධුර කාලය සහ ඔවුන්ගේ බලතල සහ කාර්ය;

(ඇ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්කර ගැනීම, නෙරපීම සහ සාමාජිකත්ව ගාස්තු;

(ඈ) සංස්ථාවේ දේපල, පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරකාරත්වය, ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය;

(ඉ) කමිටුවේ යම් රැස්වීමක දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එහි ගණ පූරණය සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයට ම සහ එවැනි ම වූ රැස්වීමක දී, සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සම්මාදම්, ආධාර මුදල් හෝ ප්‍රදාන වශයෙන් මින් පෙර හෝ මින් මතු ලැබෙන සියලු මුදල් සංස්ථාවේ අරමුදල වෙනුවෙන් කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවෙහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

**9.** (1) සංස්ථාව විසින් එහි සියලු ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම්, කමිටුව විසින් පත් කරන ලද සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ “සුදුසුකම් ලත් විගණකවරයා” යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් සේවයෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ

අදහස් වේ.

**10.** (1) කමිටුව විසින් විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය ද සමග එක් එක් මුදල් වර්ෂය සඳහා සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කර එම වාර්තාව හා ගිණුම් ප්‍රකාශය සමාජ සේවා කටයුතු විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධානය (ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ) පනතේ සඳහන් රෙජිස්ට්‍රාර්වරයා වෙත, එම වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ මාස හයක කාලයක් ඉකුත් වීමට පෙරාතුව භාරදෙනු ලැබිය යුතු ය. වාර්ෂික වාර්තාව.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට සංස්ථාව විසින් ලබාගත් විදේශීය සහ දේශීය මුදල්වලට අදාළ වෙනම ගිණුම් වාර්තාවක් අමුණා තිබිය යුතු වේ.

**11.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහි ලා බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපල මේ පනතේ විධිවිධාන සහ සංස්ථාවේ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ ඒ දේපල අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරීම.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනමේ පැවති සියලු ණය සහ බැරකම් මින් පිහිටුවනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

අයවිය යුතු සියලු ණය හා පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

13. සභාපති සහ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, සංස්ථාවේ වෙනත් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී සාමාජිකයන් විසින් ඔවුන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් සාධන පත්‍රයෙහි ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපල.

14. සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ එසේ කිරීමට පෙර හෝ කමිටුවේ සාමාජිකයන් විසින් එවැනි ආයතනයන් තීරණය කළ යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් සුරැකීම.

15. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.